6. මීයන් මර්දනය සඳහා පහත සඳහන් දේ අනුගමනය කරන්න.

- මී නාශක තැබීම.
- මී උගුල් තැබීම.
- මී ගුල් විනාශ කිරීම.
- කබරගොයි, තලගොයි, සර්පයින්, බකමූණන්, බස්සන් වැනි මීයන්ව ආහාරයට ගන්නා සතුන් විනාශ කිරීමෙන් වැලකීම.
- බකමූණන්, බස්සන් වැනි මීයන්ව ආහාරයට ගන්නා පක්ෂීන් කුඹුරු ආශ්‍රිතව ගැවසීම වැඩි කිරීම සඳහා ඉණි හෝ පොල්පිති සිටුවීම.
- මීයන් විනාශ කිරීම සඳහා ඔබ දන්නා කෙම් ක්‍රම භාවිතා කිරීම.







## මී උණ රෝගය ඔබ ප්‍රදේශයේ පැතිරී ඇත්නම් කළ යුතු දේ මොනවාද ?

1. ඉහත සඳහන් රෝග ලක්ෂණ කිසිවක් ඇත්නම් වහාම වෛද්‍යවරයෙකු හමුවන්න.

2. (i) කුඹුරු, වගුරු බිම්, ඇලවේලි ආශ්‍රිතව නිතර වැඩ වල නියැලි සිටින අය තම වැඩ ආරම්භ කිරීමට සතියකට පෙර ආරක්ෂිත ප්‍රතිකාර පිළිබඳව උපදෙස් ලබා ගැනීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක හමුවන්න.

   (ii) මෙම බෙහෙත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන් (පී.එච්.අයි.) නොමිලේ ලබා ගතහැක.

3. ප්‍රදේශයේ රෝගීන් වාර්තා වන්නේ නම් හැකි ඉක්මනින් සෞඛ්‍ය බලධාරීන්ට දැනුම් දෙන්න.

4. ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා හමු වී ඔබට අවශ්‍ය වැඩිදුර උපදෙස් ලබාගන්න.

නිපැයුම : සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය.
වසංගත රෝග විද්‍යා අංශය

© - 2008

Design by j ADS 077-3331919

# මී උණ

## ලෙප්ටොස්පයිරෝසියාව



## මී උණ යනු කුමක්ද ?

මී උණ(වෙල් උණ, පතල් උණ, මඩ උණ) කියන්නේ මීයන්ගෙන් හා සමහර සතුන්ගෙන් (ගවයන්, මී ගවයන්) බෝවන උණ රෝගයක්.

මී උණ බෝ කරන්නේ බැක්ටීරියාවක්.

රෝගය වැළඳුණු මීයන් පිට කරන මුත්‍රා සමඟ මෙම බැක්ටීරියාව බාහිර පරිසරයට එක් වෙනවා.

කුඹුරු වල ඇති දිය කඩිති හා ජලය රැඳුණු තැන් වල මෙම බැක්ටීරියාව රැඳී තිබෙනවා.



## එම බැක්ටීරියාව අපේ ශරීරයට ඇතුල් වන්නේ කෙසේද ?

ශරීරයේ කැපුණු, සීරුණු තුවාල සහ ඇසට නොපෙනෙන තරමේ සියුම් තුවාල සහිතව කුඹුරුවල වැඩ කරන විට.

කුඹුරු ආශ්‍රිත ගලා නොයන දිය කඩිති වල නෑමේදී, ඇස්වල ඇති සියුම් පටක තුළින්.

මී මුත්‍ර මිශ්‍ර ජලය බීමට ගැනීමෙන් හෝ එම ජලයෙන් කට සේදීමෙන්.



පුරන් වු කුඹුරකට බසින ගොවියෙක් නම් ඔබට මෙම රෝගය වැළඳීමේ අවදානම වැඩිය.

## රෝග ලක්ෂණ මොනවාද ?

- **උණ**
- **මස් පිඩු වල තද බල වේදනාව**
- **ඇස් තද රතු පැහැ වීම**

ඉහත ප්‍රධාන රෝග ලක්ෂණ සමඟ

- වමනය
- හිසරදය
- අප්‍රාණික බව
- මුත්‍රා තද කහ පැහැ වීම
- මුත්‍රා සමඟ ලේ යාම
- මුත්‍රා යාම අඩුවීම

වැනි රෝග ලක්ෂණද තිබිය හැක.
සමහර රෝගීන් කලාතුරකින් රෝග ලක්ෂණ නොපෙන්වා වුවද සිටිය හැක.

## නිසි කලට නිසි ප්‍රතිකාර ලබා නොගතහොත්........

- වකුගඩු, හෘදය, මොළය වැනි අවයව වලට විවිධ බලපෑම් ඇති කරමින් මෙම රෝගය මාරාන්තික වේ.

**රෝගියකුගෙන් තවත් කෙනෙකුට මෙම රෝගය බෝ වන්නේ නැත.**

## මී උණ රෝගයෙන් වැළකී සිටීමට කුමක් කළ යුතුද ?

1. කුඹුරු අවට ඇති පරිසරය පිරිසිදුව තබා ගන්න.
2. වගා බිම් සැකසීමේදී අත් හා පා ආවරණ පළඳින්න.
3. ජලය රැඳුනු ස්ථාන වල ජලය බැස යාමට සලස්වන්න.



4. කුඹුරු වලට සහ ජලය රැඳුණු තැන්වලට අනවශ්‍ය ලෙස බැසීමෙන්, නෑමෙන්,අත් පා,මුහුණ කට සේදීමෙන් වළකින්න.
5. නෑමට හා බීමට ජලය ලබාගන්නා අනාරක්ෂිත ළිං, සතුන්ගේ මළ මුත්‍ර මිශ්‍ර ජලයෙන් අපිරිසිදු වීම වළක්වා ගැනීම සඳහා ළිං බැම්මකින් ආරක්ෂා කරන්න.